(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක **28**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2023 මැයි 26 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **නලින් ප්‍රනාන්දු මහතා,** වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා

ගරු **නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **චාමර සම්පත් දසනායක මහතා,** ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුප පස්කුවල් මහතා,** සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **නීතිඥ තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **වජිර අබේවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **ගෝවින්දන් කරුණාකරම් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **නීතිඥ සාගර කාරියවසම් මහතා**

ගරු **ජයන්ත කැටගොඩ මහතා**

ගරු **නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ.ජයතිලක මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානි සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 106 හි විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චාල්ස් නිර්මලනාදන් මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

**2. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1)නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2017/2018 සහ 2018/2019 වර්ෂ සඳහා සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2022 වර්ෂය සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2022 වර්ෂය සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(vii) 2022 වර්ෂය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 13, 14, 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117 වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 අගෝස්තු 09 දිනැති අංක 2292/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම නියෝග වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**: (1) පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නසීර් අහමඩ් මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද 2020 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු රොෂාන් රණසිංහ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු ඩී. වීරසිංහ මහතා විසින් එකී කාරක සභාවට යොමු කරන ලද —

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020 වර්ෂය සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) ආහාර සුරක්ෂිතතාවය සහ කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ඩී. වීරසිංහ මහතා විසින් එකී කාරක සභාවට යොමු කරන ලද —

(i) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(ii) 2020 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i)දඹුල්ල, දඹුලු ඔය, මොරගොල්ලෑව වත්ත, 5 වන පටුමග, අංක 139/3 දරන ස්ථානයෙහි පදිංචි එන්.එම්. දයාවංශ මහතාගෙන් ලැබුණු 2023.03.20 දිනැති පෙත්සම;සහ

(ii) වත්තල, හුණුපිටිය, නාහේනවත්ත, අංක 132/93/F දරන ස්ථානයෙහි පදිංචි පී.ඩී. ෂර්ලි ගුණවර්ධන මහතාගෙන් ලැබුණු 2023.03.24 දිනැති පෙත්සම ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කළුතර, දොඩන්ගොඩ, තුඩුගල, කොස්වත්ත යන ලිපිනයෙහි පදිංචි කන්දගමගේ දෝන තිලකා රංජනී මහත්මියගෙන් ලැබුණු 2022.12.27 දිනැති පෙත්සම ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කනත්තේවැව, හබරව යන ලිපිනයෙහි පදිංචි වයි.එම්. පුෂ්පානන්ද යාපා මහතාගෙන් ලැබුණු 2023.03.23 දිනැති පෙත්සම ගරු ඩී. බී. හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම්**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2023 පෙබරවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධානවල සහ 2023 පෙබරවාරි 10 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණද, 2023 මැයි 24 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, නවවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරයේ සේවය කිරීම සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් (20) සමන්විත විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7. **වරප්‍රසාද**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2022 ඔක්තෝබර් 21 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118 හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

8. **පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය**: ගරු ඉරාන් වික්‍රමරත්න මහතා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට යොමු කරන ලදී.

9. **ශෝක ප්‍රකාශ යෝජනා**: අධ්‍යාපන අමාත්‍යවරයා විසින් අභාවප්‍රාප්ත ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු කතානායකවරයා පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

"ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය" යි වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

( පූ.භා. 10.50 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවාය.)

"ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ. භා. 11.29 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

"ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 12.27 ට ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

අභාවප්‍රාප්ත ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු කතානායකවරයාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනා අනුමත කරමින් කථානායකවරයා සමඟ ඊට එකතු වූ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මෙම යෝජනා සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරියට නියෝග කරන ලදී.

**10**. **කල් තැබීම:** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය”යි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා 12.57 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2023 ජූනි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.